# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No. PFD/RED/Cir/01
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2018.01.17

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2018

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - 2018</u>**

**<u>රාජ්‍ය ආයතන විසින් සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු</u>**

අමාත්‍යාංශ, පළාත් සභා, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා දැනට අයකරනු ලබන ගාස්තු පසුගිය වසර 03 ක කාලයක් තුළ සංශෝධනය කර නොමැති නම් එම ගාස්තු 15%කින් ඉහළ දැමීමට 2017 වර්ෂයේ පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද 2018 වර්ෂය සඳහා වූ අයවැය යෝජනාවන්හි 261 වන යෝජනාව අනුව තීරණය වී ඇත.

02. ඒ අනුව රාජ්‍ය ආයතන විසින් ලබාදෙන සේවාවන් සඳහා ගාස්තු අයකිරීමේදී එම සේවා සැපයීම සඳහා වන පරිපාලනමය වියදම් ආවරණය වන ආකාරයටත්, සේවාවන් ලබා ගන්නා මහජනයාට දැරීමට හැකිවන ආකාරයටත් ඔබ ආයතන විසින් අයකරනු ලබන ගාස්තු 15% කින් සංශෝධනය කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට යොමු කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2018.02.15 දිනට පෙර යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. පසුගිය වර්ෂ 03 ක (2015/2016/2017) කාලය තුළ අවම වශයෙන් 15%කින් ගාස්තු සංශෝධනය කර ඇති රාජ්‍ය ආයතන විසින් ඉහත 02 ඡේදය පරිදි කටයුතු කිරීම අවශ්‍ය නොවේ. එම ආයතන මෙම චක්‍රලේඛයට උපලේඛන I ලෙස අමුණා ඇති ආකෘතිය අනුව පසුගිය වසර 03හි සංශෝධනය කරන ලද ගාස්තු පිළිබඳව විස්තරයක් 2018.01.31 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ යුතු බව ද කාරුණිකව දන්වමි.

04. පසුගිය වර්ෂ 03ක කාලය තුළ 15%කට වඩා අඩු ප්‍රතිශතයකින් ගාස්තු සංශෝධනය කර ඇති ආයතන වේ නම් එම ආයතන විසින් ද අදාළ ගාස්තු 15% ක උපරිමයක් තුළ වැඩි කෙරෙන පරිදි සංශෝධනය කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට යොමු කිරීම සඳහා ඉහත 02 ඡේදයේ සඳහන් ලෙස මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2017.02.15 දිනට පෙර යොමු කිරීමට කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි. එම ආයතන විසින් ද මෙම චක්‍රලේඛයට උපලේඛන I ලෙස අමුණා ඇති ආකෘතිය අනුව පසුගිය වසර 03හි සංශෝධනය කරන ලද ගාස්තු පිළිබඳව විස්තරයක් 2018.01.31 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ යුතු බව කාරුණිකව දන්වමි.

ආර්.එච්.එස්.සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති

උපලේඛනය - I

ආකෘතිය 1

**ගාස්තු සංශෝධනය පිළිබඳ විස්තර - 2015/2016/2017**

ආයතනයේ නම:- ......................................................

අමාත්‍යාංශය :- .............................................................

| ගාස්තු සංශෝධනය කරන ලද වර්ෂය | සංශෝධනය කරන ලද ගාස්තු වර්ගය | සංශෝධනය කල ගාස්තුව | | 2015/2016/2017 වර්ෂවල එක් එක් ගාස්තුව යටතේ ලබා ගත් මුළු ආදායම (දළ වශයෙන්) රු. | එම ආදායම බැර කරන ලද ආදායම් ශීර්ෂය |
|---|---|---|---|---|---|
| | | ප්‍රතිශතය | වටිනාකම<br>සිට දක්වා | | |
| | | | | | |